සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය - I

12 ශ්‍රේණිය | **කාලය පැය 02 යි.**

උපදෙස් :-
- අංක 01 - 50 තෙක් වූ එක් එක් ප්‍රශ්නයට 1, 2, 3, 4, 5 යන පිළිතුරු වලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ පිළිතුර තෝරාගෙන එය ලකුණු කරන්න.
- එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 ක් හිමි වේ.

---

(01) ස්වමත සාධනය සහ පරමත ඛණ්ඩනය සඳහා අත්‍යවශ්‍ය දෙයකි,

(1) ප්‍රස්තුත (2) තර්ක (3) පද (4) රීති (5) වාක්‍ය (......)

(02) නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) යම් තර්කයක අවයව හා නිගමනය අතර ඇති සම්බන්ධතාව එක්කෝ නිගාමී නැත්නම් උද්ගාමී වේ.
(2) නිරීක්ෂිත දත්ත සමූහයකින් සාමාන්‍යකරණයකට පැමිණේ නම් එය නිගාමී තාර්කික සම්බන්ධතාවයකි.
(3) ආනුභාවික ක්ෂේත්‍රයෙහි යොදා ගන්නා උද්ගාමී තර්ක ආචාර ධර්ම ක්ෂේත්‍රයෙහිද යොදාගත හැකිය.
(4) ආචාර ධර්ම ක්ෂේත්‍රයෙහි පවත්නා තර්ක නිගාමී තර්කයට සමානය.
(5) ආචාර ධර්ම ක්ෂේත්‍රයෙහි යෙදෙන සංකල්ප තුළ විස්තරාත්මක බවක් දැකිය හැකිය. (......)

(03) තර්ක ශාස්ත්‍රයට අනෙකුත් විෂයන් අතර වැදගත් තැනක් හිමි වන්නේ,

(1) එය ගණිතය ඇසුරු කරගත් විෂයක් නිසාය.
(2) විද්‍යා අධ්‍යයනයට පදනමක් වන හෙයිනි.
(3) භාෂාව නිවැරදිව භාවිතා කිරීමට පදනම් වන හෙයිනි.
(4) සප්‍රමාණ නිගමන වලට එළඹීමට සහය වන හෙයිනි.
(5) මිනිස් ඥාණය හා සම්බන්ධ සෑම විෂයකටම පදනම් විෂයක් සේ සැළකෙන හෙයිනි. (......)

(04) ඇරිස්ටෝටල් ජීවත් වූ කාල සීමාව වන්නේ,

(1) ක්‍රි.පූ. 322 384 (2) ක්‍රි.ව. 322 384 (3) ක්‍රි.පූ. 384 322
(4) ක්‍රි.පූ. 384 310 (5) ක්‍රි.ව. 310 384 (......)

(05) උද්ගාමී අනුමානය පිළිබඳ නිවැරදි නිර්වචනය කුමක් ද?

(1) අවයව අතර රූපික සම්බන්ධය ගැන නොසොයා නිගමනයට එළඹෙන තර්ක ක්‍රමයයි.
(2) අවයව සත්‍ය නම් නිගමනයද සත්‍ය වන තර්ක ක්‍රමයයි.
(3) අවයව සත්‍ය වන විට සත්‍ය වීමට සම්භාවිතාවක් ඇති නිගමන ලබා දෙන තර්ක ක්‍රමයයි.
(4) අවයව හා නිගමන අතර ඇති සම්බන්ධය සත්‍යදැයි පරීක්ෂා කර බලන තර්ක ක්‍රමයයි.
(5) අවයව වල සත්‍ය අසත්‍යතාව පරීක්ෂා නොකර නිගමනයකට එන තර්ක ක්‍රමයයි. (......)

(06) සාමාන්‍ය පදයකට විශේෂණ පදයක් එකතු කළ විට එම පදය,

(1) සංයුක්ත පදයකි (2) පුද්ගලාර්ථ නාමයකි
(3) සමූහවාචී පදයකි (4) ඒකීය ලෙස විස්තරාත්මක පදයකි
(5) සාමාන්‍ය පදයකි (......)

(07) ''ලංකාව ආසියා මහාද්වීපයේ පිහිටා ඇත.'' මෙම ප්‍රස්තුතය,

(1) විශ්ලේෂී සත්‍ය (2) විශ්ලේෂී අසත්‍ය (3) සංශ්ලේෂී අසත්‍ය
(4) සංශ්ලේෂී සත්‍ය (5) මේ එකක්වත් නොවේ (......)

(08) ප්‍රස්තුතයන් එකකට වඩා ඇතුලත්ව තැනෙන ප්‍රස්තුත හඳුන්වන නාමය,

(1) සෝපාධික (2) වියෝජක (3) සංයෝජක (4) සංකීර්ණ (5) සරල (......)

(09) පරිණාමවාදයේ පියා වන්නේ,

(1) චාල්ස් ලයිල් (2) ලැමාර්ක් (3) ඇල්ෆ්‍රඩ් රසල් වොලස්
(4) වයිස්මාන් (5) චාල්ස් ඩාර්වින් (......)

(10) මහා පිපුරුම්වාදය ඉදිරිපත් කළ විද්‍යාඥයා,

(1) ජෝර්ජ් ගැමොව් (2) තෝමස් ගොල්ඩ් (3) ෆ්‍රෙඩ් හොයිලි
(4) චන්ද්‍රා වික්‍රමසිංහ (5) බෝනර් (......)

(11) අන්‍යෝන්‍ය ලෙස දෙපසටම ක්‍රියාත්මක වන සම්බන්ධය,

(1) වියුක්ත පදයකි. (2) සංයුක්ත වේ. (3) සමමිතික වේ.
(4) අසමමිතික වේ. (5) අසමමිතිකය. (......)

(12) පදයක අදහස පැහැදිලි කර ගැනීමට තවත් පදයක් සහය කරගනී නම් එය,

(1) සාමාන්‍ය පදයකි (2) සමූහවාචී පදයකි (3) සංයුක්ත පදයකි
(4) ප්‍රතිජානන පදයකි (5) සාපේක්ෂ පදයකි (......)

(13) පහත විෂයයන්ගෙන් ව්‍යවහාරික විද්‍යාවක් නොවන්නේ,

(1) පරිගණක විද්‍යාව (2) නාරිවේදය (3) ඍග් වේදය
(4) රසායනික චිකිත්සාව (5) දන්ත වෛද්‍ය විද්‍යාව (......)

(14) පහත විෂයවන්ගෙන් සමාජ විද්‍යාවක් නොවන්නේ,

(1) ජාන විකාශ විද්‍යාව (2) ආචාර විද්‍යාව (3) ආර්ථික විද්‍යාව
(4) පුරා විද්‍යාව (5) ඉතිහාසය (......)

(15) ප්‍රස්තුතයක වාචකයෙන් පැවසෙන දෙය වාච්‍යය අයත් වර්ගයේ සියලුම දේට අදාළ වේ නම් එය .... ප්‍රස්තුතයකි. හිස්තැනට අදාළ පිළිතුර,

(1) සර්වවාචී ප්‍රතිජානන (2) සර්වවාචී නිශේධන (3) ඒකවාචී ප්‍රතිජානන
(4) ඒකාධිවාචී (5) සර්වවාචී (......)

(16) A, B වන අතරම B නොවී සිටිය නොහැකිය. මෙයට අදාළ චින්තන නියමය,

(1) අනන්‍යතා (2) මධ්‍ය බහිෂ්කෘත (3) අවිහිංසාවාදී
(4) ද්විත්ව නිශේධන (5) පර්යාප්ත හේතු මූලධර්මය (......)

(17) සමාජ විද්‍යාවන්ගේ ක්ෂේත්‍රය වන්නේ,

(1) ස්වභාව ධර්මය හා පරිසරයයි.
(2) සචේතනික හා අචේතනික වස්තූන්ය.
(3) මිනිසා සහ භෞතික වස්තූන්ය.
(4) මිනිසා සහ සමාජගත සත්වයාගේ හැසිරීම් රටාය.
(5) ස්වභාව ධර්මයේ සජීවී වස්තූන්ය. (......)

(18) විශ්වය ජලයෙන් සෑදී ඇතැයි ප්‍රකාශ කළේ,

(1) හෙරක්ලයිටස් (2) පයිතගරස් (3) ටොලමි
(4) තේලීස් (5) ඇනෙක්සිමිනිස් (......)

(19) කිසියම් ප්‍රස්තුතයක සමන්විත අංග සියල්ලම සිදුවන බව කියැවෙන ප්‍රස්තුත,

(1) නිරුපාධික (2) සංයෝජක (3) විශ්ලේෂී (4) සංස්ලේෂී (5) සෝපාධික (......)

(20) ප්‍රස්තුතයක සත්‍යාසත්‍යාතාව සොයා බලන ආකාරය මත ඇතිවන ප්‍රස්තුත වර්ග දෙක වන්නේ,

(1) සරල / සංකීර්ණ (2) සංශ්ලේෂී / විශ්ලේෂී (3) ප්‍රතිජානන / නිශේධන
(4) නිරුපාධිත / සෝපාධිත (5) අණුක / පරමාණුක (......)

(21) ආනුභූතික විද්‍යාවක් පමණක් දක්වෙන පිළිතුර,

(1) ජීව විද්‍යාව, රසායන විද්‍යාව, ශුද්ධ ගණිතය.
(2) ජීව විද්‍යාව, රසායන විද්‍යාව, තර්ක ශාස්ත්‍රය.
(3) භූගෝල විද්‍යාව, ජීව විද්‍යාව, ශුද්ධ ගණිතය.
(4) භූගෝල විද්‍යාව, ජීව විද්‍යාව, ආර්ථික විද්‍යාව.
(5) භූගෝල විද්‍යාව, ජීව විද්‍යාව, තර්ක ශාස්ත්‍රය. (......)

(22) කාල් පොපර් දක්වන තරම් පහසුවෙන් උපන්‍යාසයක් ඉවත නොදමන බවට උදාහරණයක් විද්‍යාවේ ඉතිහාසයෙන් දක්විය හැකිය. එනම්,

(1) යුරේනස්ගේ කක්ෂය පිළිබඳ අනාවැකිය අසත්‍ය වූ අවස්ථාව.
(2) අංශුවාදය අසත්‍යකරණය වූ අවස්ථාව.
(3) පෘථිවි කේන්ද්‍රවාදය අසත්‍ය වූ අවස්ථාව.
(4) ප්ලොජිස්ටන් වාදය අසත්‍ය වූ අවස්ථාව.
(5) ඖපපාතික ජනනවාදය අසත්‍ය වූ අවස්ථාව. (......

(23) ගුණවත් බව යන්න,

(1) සංයුක්ත පදයකි. (2) ඒකවාචී පදයකි. (3) සාමාන්‍ය පදයකි.
(4) ව්‍යුක්ත පදයකි. (5) ප්‍රතිජානන පදයකි. (......)

(24) වචන වැඩි ගණනකින් වුවද පදයක් සෑදිය හැකිය. මෙම ප්‍රකාශය,

(1) අසත්‍යයි. (2) සත්‍යයි.
(3) සත්‍ය මෙන්ම අසත්‍යද නොවේ. (4) සත්‍යයට ආසන්නය.
(5) සත්‍යයෙන් තොරය. (......)

(25) එක්කෝ සුනිල් දිනයි නැත්නම් පරදී යන්න,

(1) විද්‍යාත්මකයි. (2) ආනුභූතික සත්‍යයකි. (3) ඇගයුම්ශීලී ප්‍රකාශයකි.
(4) විද්‍යාත්මක නොවේ. (5) සත්‍යය ප්‍රකාශයකි. (......)

(26) 'විද්‍යාව නිර්වචනයෙන් ආරම්භ වී නිර්වචනයෙන් අවසන් වේ.'

(1) ෆ්‍රැන්සිස් බේකන් (2) බෙන්තම් (3) ගැලීලියෝ
(4) ඇරිස්ටෝටල් (5) කාල්පොපර් (......)

(27) සියලු විද්‍යාවන්ට පදනම් වන්නේ,

(1) ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය (2) බුද්ධිය (3) තර්කය

(4) තර්කය හා බුද්ධිය (5) ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය හා බුද්ධිය (......)

(28) එකවර සත්‍ය විය නොහැකි නමුත්, එකවර අසත්‍ය විය හැකි පද,

(1) විසංවාදී වේ. (2) සංයුක්ත වේ. (3) ප්‍රත්‍යනික වේ.

(4) සාමාන්‍ය වේ. (5) වියුක්ත වේ. (......)

(29) වර්තමානයේ දී නවීන තාක්ෂණය බහුල ලෙස යොදා ගන්නා සමාජ විද්‍යාවක් වන්නේ,

(1) ඉතිහාසය (2) සමාජ විද්‍යාව (3) දේශපාලන විද්‍යාව

(4) අපරාධ විද්‍යාව (5) වාග් විද්‍යාව (......)

(30) ක්‍රි.පූ. 3 වැනි සියවසේ දී සූර්ය කේන්ද්‍රවාදී අදහස් පළ කළේ,

(1) ටොලමි (2) ඉයුඩොක්සස් (3) ඇරිස්ටෝටල්

(4) කොපර්නිකස් (5) ඇරිස්ටාකට් (......)

(31) නිගාමී විධික්‍රම දෙකෙහි සමානකමක් වන්නේ,

(1) මේ ක්‍රම දෙකම ආනුභූතික පරීක්ෂණ ක්‍රමය අදාළ කර නොගනී.

(2) මේ ක්‍රම දෙකම උද්ගාමී සංත්‍යක්ෂණ ක්‍රමය භාවිතා කරයි.

(3) මේ ක්‍රම දෙකම ප්‍රාථමික කරුණු, ගණිතය හා තර්කය පදනම් කරගෙන අනාවැකි ලබාගනී.

(4) මේ ක්‍රම දෙකටම අදාළ වන උපන්‍යාස, අන්තර්ගතය වැඩි ඒවාය.

(5) මේ ක්‍රම දෙකටම අනුව උපන්‍යාසයක සත්‍යතාව අවධාරණය කෙරේ. (......)

(32) ඇරිස්ටෝටලියානු තර්ක ක්‍රමය,

(1) ඇගයුම් රහිත එකකි

(2) චතුෂ්කෝටික තර්ක ක්‍රමයකි

(3) තෙ ඇගයුම් හෙවත් ත්‍රිකෝටික තර්ක ක්‍රමයකි.

(4) භව්‍යතා රාශියක් ඇති එකකි.

(5) දෙඇගයුම් තර්ක ක්‍රමයකි. (......)

(33) ස්වභාවික විද්‍යාවන් පමණක් සඳහන් වරණය කුමක්ද?

(1) ජීව විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව

(2) ජීව විද්‍යාව, රසායන විද්‍යාව, භූගෝල විද්‍යාව

(3) මානව විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව

(4) මානව විද්‍යාව, ආර්ථික විද්‍යාව, භෞතික විද්‍යාව

(5) භාෂා ශාස්ත්‍ර, ආර්ථික විද්‍යාව, භෞතික විද්‍යාව (......)

(34) නිගාමී ක්‍රමයට අනුව සප්‍රමාණ නිගමනයක් ලබා ගැනීමේදී අදාළ තර්කයෙහි අවයව,

(1) සත්‍ය විය යුතුයි. (2) අසත්‍ය විය යුතුයි.

(3) සත්‍ය වීම අත්‍යවශ්‍ය නොවේ. (4) සත්‍ය හෝ අසත්‍ය වීම යුතුමය.

(5) අසත්‍ය වීම අත්‍යවශ්‍ය නොවේ. (......)

The National e-learning Portal for The General Education

(35)
- ත්‍රිකෝණයට කෝණ 03 ක් ඇත.
- උත්සහය ඇත්නම් ජය ලැබේ.
- පේරාදෙණියේ විශ්ව විද්‍යාලයක් ඇත.
- ඔහු එක්කෝ තේ බොයි නැත්නම් කෝපි බොයි.
- ඔහු තේ මෙන්ම කෝපි ද බොයි.

මෙම ප්‍රස්තුත වර්ග අනුපිළිවෙල දැක්වෙන වරණය,

(1) විශ්ලේෂී, සෝපාධික, සංශ්ලේෂී, වියෝජක, සංයෝජක.
(2) විශ්ලේෂී, සෝපාධික, සංශ්ලේෂී, සංයෝජක, වියෝජක.
(3) විශ්ලේෂී, සෝපාධික, වියෝජක, සංශ්ලේෂී, සංයෝජක.
(4) සෝපාධික, විශ්ලේෂී, වියෝජක, සංයෝජක, සංශ්ලේෂී.
(5) වියෝජක, විශ්ලේෂී, සෝපාධික, සංශ්ලේෂී, සංයෝජක. (......)

(36) නිගාමී විධික්‍රම දෙකෙහි අසමානකමකි,

(1) සත්‍යෝක්ෂණවාදය උපන්‍යාසයක අසත්‍යතාවත්, අසත්‍යකරණවාදය, සත්‍යතාවත් අවධාරණය කරයි.
(2) සත්‍යෝක්ෂණවාදී තාර්කික ව්‍යුහය නිෂ්ප්‍රමාණ ද, අසත්‍යකරණවාදී ව්‍යුහය සප්‍රමාණ ද වේ.
(3) සත්‍යෝක්ෂණවාදී නිගමනය සම්භාවිතාවෙන් යුක්ත වන අතර අසත්‍යකරණවාදී නිගමන ස්ථිර වේ.
(4) සත්‍යෝක්ෂණවාදය අනාවැකි ලබා ගැනීමට ප්‍රාථමික කරුණුත් අසත්‍යකරණවාදය ප්‍රාථමික කරුණු හා සහයක උපන්‍යාසත් යොදා ගනී.
(5) අසත්‍යකරණවාදය සත්‍යෝක්ෂණවාදයට වඩා ආනුභූතික බවෙන් වැඩිය. (......)

(37) කුවේණිගේ දරුවන් දෙදෙනා යන්න,

(1) සාමාන්‍ය පදයකි. (2) සමමිතික පදයකි. (3) වියුක්ත පදයකි.
(4) සාපේක්ෂ පදයකි. (5) ඒකවාචී පදයකි. (......)

(38) විවාහකයා වැන්දඹුව යන්න,

(1) ප්‍රත්‍යනිකය. (2) විසංවාදී වේ.
(3) ප්‍රත්‍යනික මෙන්ම විසංවාදී වේ. (4) ප්‍රත්‍යනික නොවේ.
(5) ප්‍රත්‍යනිකවත්, විසංවාදීවත් නොවේ. (......)

(39) ආනුභූතික නොවන විද්‍යාවට පදනම් වන්නේ,

(1) තර්කය (2) පුනර්වාචකයකි (3) සරල
(4) අසථ්‍යුටතාවයෙන් යුක්තය (5) අධිභෞතිකය (......)

(40) මුලින්ම දුරදක්නය නිපදවන ලද්දේ,

(1) ගැලීලියෝ (2) ලිපර්ෂි හැන්සි (3) ලයිසෙන්කෝ
(4) ෆ්‍රැන්සිස් ක්‍රික් (5) විලියම් කොක් (......)

(41) නවීන විද්‍යාවේ ආරම්භයට චීනයෙන් ලැබුණු දායකත්වය <u>නොවන්නේ,</u>

(1) වෙඩි බෙහෙත් සොයා ගැනීම. (2) මුද්‍රණ ශිල්පය නිපදවීම.
(3) මාලිමා යන්ත්‍රය නිපදවීම. (4) අම්ලකර සොයා ගැනීම.
(5) චුම්බකත්වය සොයා ගැනීම. (......)

The National e-Learning Portal for the General Education

(42) පුස්තකාලය යන පදය අයත් පද වර්ගය,

(1) ඒකවාචී (2) වෛල්‍යවාචී (3) පොදු සාමුහික
(4) ඒකවාචී සාමුහික (5) ප්‍රතිජානන (......)

(43) පේරාදෙණිය විශ්ව විද්‍යාලය යන පදය,

(1) සංයුක්ත පදයකි. (2) ඒකවාචී පදයකි. (3) නිරපේක්ෂ පදයකි.
(4) වියුක්ත පදයකි. (5) ප්‍රතිජානන පදයකි. (......)

(44) ඇගයුම්ශීලී විද්‍යාවන් පමණක් සඳහන් වන වරණය කුමක්ද?

(1) ආචාර විද්‍යාව, සංගීතය, මනෝ විද්‍යාව (2) සංගීතය, නර්තනය, ගණිතය
(3) නර්තනය, ගණිතය, සාහිත්‍යය (4) සංගීතය, පාරභෞතික විද්‍යාව, සාහිත්‍යය
(5) ආචාර විද්‍යාව, සංගීතය, සාහිත්‍යය (......)

(45) අර්ථ සම්පන්න ලෙස තවදුරටත් තැබිය නොහැකි ප්‍රස්තුත,

(1) සෝපාධික (2) වියෝජක (3) සංයෝජක (4) අණුක (5) පරමාණුක (......)

(46) විශ්ලේෂී ප්‍රස්තුතවල සත්‍යතාව නියතය. එහෙත් සංශ්ලේෂී ප්‍රස්තුතවල සම්භාවිතාවය සත්‍යයක් ඇත.

(1) ඉහත වාක්‍ය දෙකම අසත්‍යය.
(2) ඉහත මුල් වාක්‍යය අසත්‍යය වේ. දෙවැන්න සත්‍යය.
(3) ඉහත මුල් වාක්‍යය අසත්‍යය. දෙවැන්න සත්‍යයට ආසන්න වේ.
(4) ඉහත වාක්‍ය දෙකම සත්‍යයි.
(5) ඉහත මුල් වාක්‍යයේ සත්‍යතාව අවිනිශ්චිතයි. දෙවැන්න සත්‍යයි. (......)

(47) ''ආලෝකය පිළිබඳ අංශුවාදයේ අනාවැකියක් වූ ආලෝකය ජලයට වඩා අඩු වේගයකින් වාතයේ ගමන් කරයි යන්න පරීක්ෂණ මඟින් අසත්‍ය වූ නිසා අංශුවාදය අසත්‍ය සේ සලකා ප්‍රතික්ෂේප විය.'' මෙය කුමන විධික්‍රමයක් සඳහා උදාහරණ සේ ගත හැකිද?

(1) උද්ගමනවාදය. (2) සාපේක්ෂතාවාදය.
(3) නිගාමී සාපේක්ෂණවාදය. (4) නිගාමී අසත්‍යකරණවාදය.
(5) ලකටෝස්ගේ පර්යේෂණ වැඩ සටහන් ක්‍රමය. (......)

(48) ශක්තිමත් දුර්වල යන්න,

(1) සමමිතික වේ. (2) වියුක්ත වේ. (3) ප්‍රත්‍යනික වේ.
(4) සාමාන්‍ය පද වේ. (5) ඒකවාචී පද වේ. (......)

(49) A යන්න A ම වේ. යන්න,

(1) මධ්‍ය බහිෂ්කෘත නියමයයි. (2) අනන්‍යතා නියමයයි.
(3) විසංවාදී නියමයයි. (4) පර්යාප්ත හේතු නියමයයි.
(5) ද්විත්ව නිශේධන නියමයයි. (......)

(50) ජ්‍යොතිෂය පොපර්ගේ රීතියට අනුව,

(1) විද්‍යාවකි (2) ව්‍යවහාරික විද්‍යාවකි (3) ශුද්ධ විද්‍යාවකි
(4) විද්‍යාවක් නොවේ (5) ශාස්ත්‍රයකි (......)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය - II

12 ශ්‍රේණිය

කාලය පැය 03 යි.

සැලකිය යුතුයි :-

- **I, II** කොටස් දෙකෙන් ප්‍රශ්න හතර බැගින් තෝරාගෙන ප්‍රශ්න අටකට පමණක් පිළිතුරු සපයන්න. **I** කොටසේ ප්‍රශ්ණයකට ලකුණු 10 බැගින් ද, **II** කොටසේ ප්‍රශ්ණයකට ලකුණු 15 බැගින් ද ලකුණු හිමි වේ.

I කොටස

(01) (i) ''විද්‍යාව යන්නට නිර්වචන 02 ක් ලියන්න. (ල.04)

(ii) කාල්පොපර්ගේ වෙන් කර ගැනීමේ රීතිය තුළ පවත්නා ලක්ෂණ මොනවා ද? (ල.06)

(02) (i) තර්ක ශාස්ත්‍රය පිළිබඳව ඉදිරිපත් වී ඇති නිර්වචන 02 ක් ලියන්න. (ල.04)

(ii) තර්ක ශාස්ත්‍රයේ උපයෝගීතාවය විස්තර කරන්න. (ල.06)

(03) (i) තාර්කික පදයක් යනු කුමක්දැයි හඳුන්වා එහි විශේෂතාව පැහැදිලි කරන්න. (ල.4)

(ii) ''සෑම වාක්‍යයක් ම ප්‍රස්තුතයක් නොවුවත් සෑම ප්‍රස්තුතයක්ම වාක්‍යයක් වේ.'' මින් අදහස් කරන්නේ කුමක් ද යන්න ප්‍රස්තුතය හඳුන්වමින් පැහැදිලි කරන්න. (ල.6)

(04) පහත සඳහන් 02 ක් පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.

(i) නිගාමී හා උද්ගාමී තර්ක

(ii) පරමාණුක හා අණුක ප්‍රස්තුත

(iii) ඇරිස්ටෝටලියානු චින්තන නියම (ල.5×2=10)

(05) (i) ශුද්ධ විද්‍යා හා ව්‍යවහාරික විද්‍යා පැහැදිලි කරන්න. (ල.5)

(ii) ආනුභූතික විද්‍යා හා න'අනුභූතික විද්‍යා විස්තර කරන්න. (ල.5)

II කොටස

(06) (i) විද්‍යාඥයාගේ හා විධි ක්‍රම වාදියාගේ කාර්ය භාරය කෙබඳුවේද? (ල.7)

(ii) උද්ගමනවාදී විධික්‍රමය හඳුන්වා විද්‍යාත්මක ගවේෂණය උදෙසා එය කොතරම් දුරට යෝග්‍යවේදැයි විවේචනය කරන්න. (ල.8)

(07) (i) පදවල තාර්කික සම්බන්ධතාවය මත කෙරෙන වර්ගීකරණය උදාහරණ සහිතව විස්තර කරන්න. (ල.7)

(ii) විධිමත් භාෂාවක ලක්ෂණ 04 ක් විස්තර කරන්න. (ල.8)

(08) (i) විද්‍යා වර්ගීකරණය නම් කරන්න. (ල.5)

(ii) විද්‍යා අතර ප්‍රභේද ඇති වීමට තුඩු දුන් කරුණු 03 ක් විස්තර කරන්න. (ල.5)

(09) (i) ඉම්රි ලකටෝස්ගේ විද්‍යාත්මක පර්යේෂණ වැඩසටහන් ක්‍රමය විස්තර කරන්න.

(ii) සාපේක්ෂක වාදය විස්තර කරන්න.

(10) පහත සඳහන් සංකල්ප පැහැදිලි කරන්න.

(i) පද ව්‍යාප්තිය
(ii) සෝපාධික සංවාක්‍ය
(iii) නිගාමී සත්‍යෙක්ෂණවාදය
(iv) නිගාමී අසත්‍යකරණ වාදය